www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ප්‍රධාන නාවික අභ්‍යාසයක් පැවැත්වෙද්දී එක්සත් ජනපද චීන ආතතීන් උග්‍ර වේ

## US-China tensions rise amid major naval exercises

**පීටර් සිමන්ඩ්ස් විසිනි**

**2016 ජූනි 16**

ඇමරිකානු නාවික හමුදාව විස්තර කල පරිදි "සංකීර්න, අධි තාක්ෂනික යුද අභ්‍යාසය" සැලසුම් කර ඇත්තේ, නාවික හමුදා තුන ඒකාබද්ධ මෙහෙයුමක නිරතවීමේ හැකියාව වැඩිකිරීමටය. "මලබාර්" යුද අභ්‍යාසය ලෙස නම්කර ඇති, සතියක කාලයක් දැනට බටහිර පැසිෆික් සාගර කලාපයේ පැවැත්වෙන එයට ඇමරිකානු, ජපන් හා ඉන්දීය යුද නැව් සම්බන්ධවී ඇත. ඉලක්කය පැහැදිලිවම චීනයයි. මෙහෙයුම ආවරනය කරන නාවික යාත්‍රා, චීනය කලාපය තුලට යවා ඇත.

මෙහෙයුම සඳහා පෙන්ටගනය, යූඑස්එස් ජෝන් සී ස්ටෙනිස් හා සමස්ත ප්‍රහාරක බල ඇනිය ද තවත් මතුපිට යාත්‍රා කරන නැව් හතරක් හා ලොස් ඇන්ජලීස් වර්ගයේ න්‍යෂ්ටික ප්‍රහාරක සබ්මැරිනයක් ද යොදවා ඇත. ඉන්දියාව රහසිගත ෆ්‍රිගේට් ආරක්ෂක නැව් දෙකක්, මිසයිල් සහිත කෝවේට් හා පරිවාරක නැව් ද ජපානය තමන්ගේ දැවැන්ත හෙලිකොප්ටර් සහිත යුද නැව ද යවා ඇත. එය වනාහි ප්‍රහාරක ගුවන් යානා වලින් සන්නද්ධ නැවක් වෙනත් ආකාරයෙන් හැඳින්වීමක් පමනි.

වොෂින්ටනය 2015 වසරේ මුල පටන් වඩ වඩාත් ඝෝෂාකාරී ව්‍යාපාරයක් දියත් කරමින්, චීනය දකුනු චීන මුහුදේ මුහුද ගොඩකිරීමේ කටයුතු වල යෙදීම "ව්‍යාප්තවාදී" හා "මිලිටරිවාදී" යයි හෙලාදැකීමට පටන් ගත්තේය. යථාර්තය නම් ඇමරිකාව, ගිනිකොන දිග ආසියාවේ චීන අසල්වැසියන්, විශේෂයෙන්ම පිලිපීනය හා වියට්නාමයත් චීනයත් අතර දිගු කලක් තිස්සේ පවතින භෞමික ගැටලු ඉව බව නැතිව ගසාකමින් සිටින බවයි. ඇමරිකානු නාවික හමුදාව අවස්ථා තුනකදීම දකුනු චීන මුහුදේ චීන පාලනය යටතේ ඇති දිවයින්වල සැතපුම් 12 සීමාව තුලට යුද නැව් යවා ඇත.

චීනයේ පැවැත්වෙන මෙවර ආසියාන් (ගිනිකොන දිග ආසියානු රටවල්) රැස්වීමේදී මේ ප්‍රශ්නය ගැන තියුනු මතභේද මතුව තිබේ. රැස්වීමේ සාමාජිකයින් දකුනු චීන මුහුදේ වැඩෙන ආතතීන් පිලිබඳව "බරපතල කනස්සල්ල" පල කරන ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත්කොට තිබේ. මීට පෙර නිකුත් කල ප්‍රකාශයන්ට වඩා දුර නොගිය ද චීනය නම් නොකල ද එය, තමන්ගේම රට තුලදී නිකුත් කිරීම චීනයට දැඩි රාජ්‍යතාන්ත්‍රික අපහසුතාවක් ඇතිකර තිබේ. පැය කිහිපයකට පසුව ආසියාන් ප්‍රකාශය ඉල්ලා අස්කර ගත්තේය. චීනය සමග වඩාත් සමීප සබඳතා ඇති රටවලට වෙනත් අදහස් තිබෙනු ඇති බව නිසැකය.

මලබාර් අභ්‍යාස පැවැත්වෙන්නේ දකුනු චීන මුහුද තුලම නොව, පිලිපීනයට නැගෙනහිරෙන් ඇති පිලිපීන මුහුදේය. එහෙත් චීනයට පහරදීමේ දුරකින් විශාල සංඛ්‍යාවක් යුද නැව් රැස්කර තිබීම ප්‍රකෝපකාරී ක්‍රියාවකි.

චීන නාවික හමුදාවේ නිරීක්ෂන යාත්‍රාවක් අභ්‍යාසය පැවැත්වෙද්දී යූඑස්එස් ස්ටෙනිස් පිටුපස පැමින ඇතැයි ඇමරිකානු නාවික හමුදාව පවසයි. ජපාන නිලධාරීන් පැවසුවේ, වෙනත් චීන නිරීක්ෂන ඔත්තු බැලීමේ යාත්‍රාවක් 15දා ජපාන මුහුදු සීමාව අසලින් කුචිනොරාබු දිවයින් පසුකර යාත්‍රා කල බවත්, ටෝකියෝවේ චීන තානාපති කාර්යාලයට මේ පිලිබඳව පැමිනිලි කල බවත්ය. පසුගිය 9දා චීන ආරක්ෂක ෆ්‍රිගේට් යාත්‍රාවක්, ජපානය සෙන්කාකු ලෙසත් චීනය ඩයේයු ලෙසත් හඳුන්වන නැගෙනහිර චීන මුහුදේ මතභේදයට ලක්ව තිබෙන දිවයින් කලාපයේ සැතපුම් 24 සීමාව තුලින් යාත්‍රා කල බව වාර්තා විය.

මලබාර් පටන් ගත්තේ ද්වි පාර්ශවික යුද අභ්‍යාසයක් ලෙස 1992දීය. ඇමරිකාව හා ඉන්දියාව ඒකාබද්ධව සිදු කල අභ්‍යාසය පසුව ජපානය ද ස්ථාවර සාමාජිකයෙක් ලෙස ඇතුලත් වන පරිදි 2014 සිට පුලුල් කරන ලදී. පසුගිය ජූලි මාසයේදී ඇමරිකානු සහකාර ආරක්ෂක ලේකම් රොබට් ස්කර් යෝජනා කලේ, ඔස්ට්‍රේලියාව ද නිතිපතා ඊට සම්බන්ධ කරගත යුතු බවයි. දැන් පැවැත්වෙන, මෙතෙක් පැවති විශාලතම අභ්‍යාසයට, සබ්මැරීන් නාශක යුද කටයුතු, ගුවන් ආරක්ෂක අභ්‍යාස හා සොයා ගලවා ගැනීමේ ක්‍රියාන්විත ඇතුලත්ය.

මලබාර් වැනි මිලිටරි අභ්‍යාස පුලුල් කිරීම, චීනය සමග යුද්ධයට සූදානම් වීම සඳහා ඉන්දු-පැසිෆික් කලාපය පුරා මිලිටරි තරකිරීම හා ඇමරිකාවේ "ආසියාවට හැරීමේ" කොටසකි. පසුගිය පස් වසර මුලුල්ලේ වොෂින්ටනය, කඩිනමින් චීනය වැටලිය හැකි ආකාරයට, මිලිටරි සන්ධාන හා මූලෝපායික හවුල්කාරිත්වයන් මෙන්ම ඕස්ට්‍රේලියාව හා පිලිපීනය වැනි තැන්වල මෙන් කඳවුරු ගොඩනැගීමේ වැඩ සටහන් සහතික කර ගැනීමට ද වෙහෙස විය.

චීනය සමග යුද්ධයේදී වොෂින්ටනයේ ගුවන්මුහුදු සටන පිලිබඳ මූලෝපායට නාවික බලය ප්‍රමුඛ වන්නේය. චීන ආර්ථිකයේ ගෙල සිරකිරීමේ එල්ලය ඇති නාවික අවහිර කිරීම් මගින් සහාය ලැබෙන, බටහිර පැසිෆික්හි කඳවුරුවල සිට, නැව් හා සබ්මැරීන් යාත්‍රාවල සිට චීනයට දැවැන්ත ගුවන් හා මිසයිල් ප්‍රහාර එල්ල කිරීම මේ සැලසුම් වලට ඇතුලත්ය. මෙම යුද සූදානමේදී ඉන්දියාව මෙන්ම ජපානය හා ඕස්ට්‍රේලියාව ද තීරනාත්මක යයි වොෂින්ටනය සැලකිල්ලට ගෙන තිබේ.

"එක්සත් ජනපදය, ඉන්දියාව හා ජපානය, ආසියාවේ ඈත මුහුදෙහි නව පර්යායක් හැඩ ගැස්වීමට පටන් ගනියි" යන හිසින් *වෝල් ස්ට්‍රීට් ජර්නලයේ* පලවූ ලිපියකින්, මලබාර් අභ්‍යාසයේ පුලුල් මූලෝපායික ඇඟවුම් ගෙනහැර දක්වා තිබුනි. එහි මෙසේ ද සඳහන් විය. "කලාපීය බලයේ තුලනය චීනයේ නැගීම තුලින් මාරුවී තිබියදී ඇමරිකාව, ඉන්දියාව සමග මූලෝපායික බැඳීම් ශක්තිමත් කර ගැනීම පිනිස කටයුතු කරමින් සිටින අතර ඉන්දියානු සාගරයේ පමනක් නොව පැසිෆික් සාගරයේද වඩා ක්‍රියාශීලී භූමිකාවක් ඉටුකිරීම සඳහා නව දිල්ලිය දිරිගන්වයි."

රටවල් තුන දැනටමත් ඇමති මට්ටමේ ත්‍රෛපාර්ශවික සාකච්ඡා ආරම්භ කර ඇත. පසුගිය වසරේ ඔවුන්ගේ විදෙස් ඇමතිවරුන්ගේ හමුවෙන් පසුව එය පටන්ගෙන තිබේ. ජපානය මෙන් ඉන්දියාව, ඇමරිකාවේ නිල මිලිටරි සහචරයෙක් නොවේ. කෙසේ වුව ද පසුගිය සතියේ වොෂින්ටනයේදී අගමැති නරේන්ද්‍ර මෝඩි ඇඟවුම් කලේ, ඉන්දියාව ඇමරිකාවේ යුද සූදානමට සමීපව ඒකාග්‍ර වන බවයි. ඉන්දු-පැසිෆික් කලාපය පුරා සෑම "අංශයකම....ගොඩබිම්, ගුවන් හා සයිබර් අවකාශයේ" වර්ධනය වන මිලිටරි සහයෝගිතාව සලකුනු කරමින් මෝඩි හා ඔබාමා ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කලහ.

ආසියාව පුරා සන්ධාන හා හවුල්කාරිත්වයන් ගොඩනගන අතර ඇමරිකාව, කලාපය තුල දැවැන්ත ලෙස සිය මිලිටරි කටයුතු ගොඩනැගීමේ හා ප්‍රතිව්‍යුහගත කිරීමේ යෙදී සිටියි. 15දා ඇමරිකානු මිලිටරිය හා ඔත්තු සේවා සමග සමීප සම්බන්ධතා සහිත දෘෂ්ටි මන්ඩලයක් වන *ස්ට්‍රැට්ෆෝ* පල කල ලිපියක, ජපානය මධ්‍යස්ථානය කරගත්, ඇමරිකාවේ 7 වන නාවික බලඇනිය සමග එරට 3 වන නාවුක බල ඇනිය වඩ වඩාත් ඒකාග්‍ර කිරීමේ ඇමරිකානු මිලිටරි සැලසුම් ගෙනහැර දක්වා තිබුනි.

මේ දක්වා 3 වන නාවික බල ඇනිය ප්‍රධානකොටම යොමුකර තිබුනේ, නැගෙනහිර හා උතුරු පැසිෆික් කලාපයට වන අතර එය දැන් වඩ වඩාත්, චීනයට යාබද බටහිර පැසිෆික් ප්‍රදේශ වෙත යොමුකර ඇත. නාමික වශයෙන් 3 වන නාවික බල ඇනියේ ආඥා යටතේ පැවති යූඑස්එස් ස්ටෙනිස් හා එහි ප්‍රහාරක බල ඇනිය, බටහිර පැසිෆික් ප්‍රදේශයේ සය මසක සංකීර්න මෙහෙයුමක් නිමා කර ඇත. අප්‍රේල් මාසයේදී 3වන නාවික බල ඇනියට අයත් ඩිස්ට්‍රෝයර් යාත්‍රා තුනක් සමගින් මුහුනත ක්‍රියාත්මක කන්ඩායම, එම පුලුල් කලාපය තුලම මාස 7ක මෙහෙයුමක යොදවා ඇත.

නාවික ප්‍රතිව්‍යුහකරනයේ එල්ලය බීජිනයට එරෙහිව යොමුකර තිබෙන බව පැහැදිලි කිරීමෙන් පසුව *ස්ට්‍රැට්ෆෝර්* මෙසේ නිගමනය කරයි. "එක්සත් ජනපදය හා ආසියාවේ අනෙකුත් නාවික හමුදා, නාවික ආරවුල් ඉහලටම නැගී ඇති අවධියකදී තම මුර සංචාර වැඩි කර තිබීම හමුවේ, සිය මුර සංචාරයන්හි බලාපොරොත්තු වන බලපෑම ඇති කිරීමට නම්, පැසිෆික්හි එක්සත් ජනපදයේ නාවික බල ඇනිවල ඒකාබද්ධ ශක්තිය පෙල ගැස්විය යුතු යයි වටහාගෙන සිටියි."

සිදු වෙමින් ඇත්තේ, යුද්ධය සඳහා සූදානම් වීමට අඩු දෙයක් නොවේ. ඉහතකී නාවික බල ඇනි දෙකට ඇමරිකාවේ ප්‍රහාරක නැව් වලින් තුනෙන් දෙකක් සතුය. ඒවාට අඩු තරමින් නැව් 200ක් හා ගුවන් යානා 1200ක් අතුලත්ය. තව ද දකුනු චීන මුහුදේ භෞමික මතභේද මුල්කරගත් ආතතීන්, එලඹෙන සතිවලදී තවත් පැතිර යනු ඇත. ඒ, හේග් හි එක්සත් ජාතීන්ගේ අභියාචන පිලිබඳ ස්ථාවර අධිකරනය, ඇමරිකාව අනුග්‍රහය ඇතිව, චීන හිමිකම්පෑමට පිලිපීනය එල්ල කල නීතිමය අභියෝගය පිලිබඳ තීන්දුව පලවීමත් සමගය.

© www.wsws.org